# 1.2 අග්යේයගේ ශේඛර්ඃ ඒක් ජීවනී හා විරාගය නවකතා පිළිබඳ ව කෙරෙන තුලනාත්මක විමර්ශනයක්

ඉන්ද්‍රා කුමාරි දසනායක
හින්දී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

---

## ABSTRACT

හින්දී සහ සිංහල සාහිත්‍යයේ නූතන යුගය, එතෙක් පැවැති සාම්ප්‍රදායික නවකතාව නව සංධිස්ථානයකට යොමු කළේ ය. මෙම යුගයේ නවකතාකරුවා යථාර්ථවාදී රීතියක් අනුගමනය කරමින් මානුෂීය අත්දැකීම් හා ආකල්ප මෙන් ම මානව චිත්ත්‍යාභන්තරය චිත්‍රණය කිරීම සඳහා වඩාත් පෙලඹුණේ, දේශීයමය වශයෙන් චිරන්තන සහ අපරදිග සාහිත්‍යයේත් ආභාසය ඇතිවය.

මනොවිශ්ලේෂණය පදනම් කොට ගෙන නවකතා රචනා කිරීම, හින්දී සාහිත්‍යයේ මෙන් ම සිංහල සාහිත්‍යයේ ද නිදහසට පසුව දක්නට ලැබුණු නව ප්‍රවණතාවකි. හින්දී නවකතාකරුවකු වන අග්යේයගේ **ශේඛර්ඃ එක් ජීවනි** නවකතාව එතෙක් පැවති සාම්ප්‍රදායික හින්දි නවකතාව නව සංධිස්ථානයකට යොමු කළේ ය. ආත්ම විශ්ලේෂණය කේන්ද්‍ර කොටගත් මෙම නවකතාවෙහි එන ප්‍රධාන චරිතය **ශේඛර්** වේ. මීට සමගාමීව සිංහලයේ මාර්ටින් වික්‍රමසිංහගේ විරාගය නවකතාව ද සිංහල මනෝවිද්‍යාත්මක නවකතා කලාවේ පෙරලියක් ඇති කළේ ය. ආත්මවිශ්ලේෂණය තුළින් තම චරිත කතාව ඉදිරිපත්කරන **අරවින්ද** විරාගයෙහි එන ප්‍රධාන චරිතය වේ. මෙම නවකතාවන්ගේ ප්‍රධාන චරිත පිළිබද ව තුළනාත්මක අධ්‍යයනයක යෙදුණු විට පෙනී යන එක් ලක්ෂණයක් වනුයේ ස්වපීඩක කාමුකත්වයෙන් (masochism) පෙළෙන පුද්ගල මානසිකත්වයි. තමාගේ සිත හා කය දුක්වේදනාදියට පාත්‍ර කිරීමෙන් කාමාශ්වාදයක් ලැබීමට පෙළඹීමේ අපගාමී චර්යා රටාව ස්වපීඩක කාමුකත්වය ලෙස සැලකෙන අතර **ශේඛර්ඃ එක් ජීවනී** හි එන ශේඛර් චරිතය සහ **විරාග**යෙහි අරවින්ද චරිතයන් කෙරෙන් එම මානසික ස්වභාව ඉදිරිපත් කිරීමට මෙම නවකතා කරුවන් සමත් වී ඇත.

පූර්වෝක්ත නවකතාවල ප්‍රධාන චරිත මගින් ප්‍රකට කෙරෙන මෙම ලක්ෂණය (masochism) පිළිබඳ ව විශ්ලේෂණය කරමින් තුලනාත්මක විග්‍රහයක නියළීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා අග්යේයගේ ශේඛර්ඃ ඒක් ජීවනි නම් නවකතාවේ ප්‍රධාන චරිතය වන **ශේඛර්**ගේ චරිතයත්, මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විරාගය නවකතාවේ එන **අරවින්ද**ගේ චරිතයත් පාදක කර ගැනේ.